වාණිජ ධාරා

(අධ්‍යාපන කාර්යාලය – බළන්ගොඩ)

ACCOUNTING - 33

නිපුණතාව 12 අනුපාත විශ්ලේෂණය

අනුශාසකත්වය : සුනිල් රාජපක්ෂ මහතා
සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ වාණිජ
සම්පත් දායකත්වය කේ.එම්.එන්.කේ.සමරකෝඩි

පරිගණක ගත කිරීම පරිගණක මධ්‍යස්ථානය - කුරුවිට

අනුපාත මගින් මූල්‍ය
ප්‍රකාශන විශ්ලේෂණය හා
අර්ථකථනය

මූල්‍ය ප්‍රකාශන විශ්ලේෂණය හා අර්ථකථනය

ව්‍යාපාරයක මූල්‍ය ප්‍රකාශන තුල අන්තර්ගත තොරතුරු යම් ක්‍රමවේදයක් භාවිතා කරමින් වඩාත් අර්ථවත් ලෙස ඉදිරිපත් කිරීමේ ක්‍රියාවලිය

විශ්ලේෂණය හා අර්ථකථනය කිරීමෙන් පහත අවශ්‍යතා ඉටු කර ගත හැකිය.

- මූල්‍ය ප්‍රකාශන වල මතුපිටින් දැක්වෙන තත්වයට වඩා අන්තර්ගතය විශ්ලේෂණාත්මකව හදුනා ගත හැකිය.
- ව්‍යාපාරයේ වර්තමාන තත්වය පිලිබද ඇගයීමක් කල හැකිය.
- අනාගත මූල්‍ය තත්වය ලාභදායීත්වය ද්‍රවශීලතාවය යනාදිය ඇස්තමේන්තු කළ හැකි වීම.
- පවත්නා වර්ෂය (ජංගම වර්ෂය) හා පෙර වර්ෂය හෝ සමාන වෙනත් ව්‍යාපාර වල දත්ත සමග සැස§මට හැකි වීම.
- යෝග්‍ය තීරණ ගැනීමට මගපෙන්වීම.

ගිණුම්කරණ අනුපාත විශ්ලේෂණය

මූල්‍ය ප්‍රකාශන වල අන්තර්ගත අයිතම අතර අර්ථාන්විත සම්බන්ධයක් ගොඩනගා ඒවා විශ්ලේශනය කිරීම අනුපාත විශ්ලේෂණය යි.

අනුපාතයක් ඉදිරිපත් කළ හැකි ආකාර

1. අනුපූරකයක්/අනුපාතයක් ලෙස - ජංගම අනුපාතය2:1
2. ප්‍රතිශතයක් ලෙස - දළ ලාභ අනුපාතය20%
3. භාග සංඛ්‍යාවක් ලෙස
4. වාර ගණනක් ලෙස හෝ දින ගණනක් ලෙස

පොලී ආවරණ අනුපාතය වාර 5 කි

ණය ගැති ගෙවීම් කාලය දිණ 60 කි.

5 : 3



ගණනය කළ අනුපාත සන්සන්දනය කිරීම

- ජංගම වර්ෂය
- ජංගම වර්ෂය හා පෙර වර්ෂය
- සමාන ව්‍යාපාර දත්ත සමඟ


අනුපාත
ද්‍රවශීලතා අනුපාත
ජංගම අනුපාතය
ක්ෂනික අනුපාතය
තෝලන අනුපාත
ණය අණුපාතය
ණය ස්කන්ධ අණුපාතය
පොලී ආවරණ අණුපාතය
ලාභදායීත්ව අනුපාත
දළ ලාභ අනුපාතය
ශුද්ධ ලාභ අනුපාතය
මුලු වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය
හිමිකම් මත ප්‍රතිලාභ අනුපාතය
ක්‍රියාකාරී අනුපාත
තොග පිරිවැටුම් අනුපාතය
තොග රැඳවුම් කාලය
ණයගැති පිරිවැටුම් අනුපාතය
ණය එකතු කිරීමේ කාලය
ආයෝජන අනුපාත
කොටසක ඉපයීම
කොටසක ලාභාංශ

ද්‍රවශීලතා අනුපාත

ව්‍යාපාරයේ කෙටිකාලීන නුබුන්වත්භාවය ඇගයීම සඳහා ද්‍රවශීලතා අනුපාත වැදගත් වේ.

1.ජංගම අනුපාතය

2.ක්ෂනික අනුපාතය

ජංගම අනුපාතය

ව්‍යාපාරයකට ජංගම වගකීම් නිදහස් කිරීම සදහා ප්‍රමාණවත් ජංගම වත්කම් තිබේද යන්න මෙම අනුපාතයෙන් පෙන්නුම් කෙරේ

ජංගම අනුපාතය = ජංගම වත්කම් : ජංගම වගකීම්

$$\text{ජංගම අනුපාතය} = \frac{\text{ජංගම වත්කම්}}{\text{ජංගම වගකීම්}}$$

මෙම අනුපාතය 2 : 1 ලෙස පැවතීම වඩාත් යෝග්‍ය ය

ක්ෂනික අනුපාතය

ව්‍යාපාරයේ ඉහල ද්‍රවශීලතාවයක් පවතින ජංගම වත්කම් පමණක් යොදා ගනිමින් ක්ෂනික අනුපාතය ගනනය කෙරේ

මෙම අනුපාතය 1:1 ක් ලෙස පැවතිය යුතු බව සාමාන්‍ය පිලිගැනීමයි.

ක්ෂනික අනුපාතය = ද්‍රවශීල වත්කම් : ජංගම වගකීම්

$$\text{ක්ෂනික අනුපාතය} = \frac{\text{ද්‍රවශීල වත්කම්}}{\text{ජංගම වගකීම්}}$$

ද්‍රවශීල වත්කම් = ජංගම වත්කම් - (තොගය + ඉදිරියට කළ ගෙවීම්)

තෝලන අනුපාත

දිගුකාලීන වගකීම් වලට
ව්‍යාපාරයට මුහුන දීමට
ඇති හැකියාව තෝලන
අනුපාත මගින් සලකා
බලයි.

1.ණය අනුපාතය
2.ණය ස්කන්ධ
අනුපාතය
3.පොලී ආවරණ
අනුපාතය

ණය අනුපාතය

ආයතනයේ මුළු ප්‍රාග්ධනයෙන් ණය ප්‍රාග්ධනය කොපමන ප්‍රතිශතයක් නියෝජනය වේද යන්න මෙයින් අදහස් වේ.

$$\text{ණය අනුපාතය} = \frac{\text{ණය ප්‍රාග්ධනය}}{\text{මුළු ප්‍රාග්ධනය}} \times 100$$

ණය ප්‍රාග්ධනය = ස්ථිර පොළී සහිත දිගු කාලීන ණය

මුලු ප්‍රාග්ධනය = සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය + සංචිත + දිගුකාලීන ණය

ණය ස්කන්ධ අනුපාතය

ණය ස්කන්ධ අනුපාතය දිගුකාලීන ණය සහ අයිතිකරුවන්ගේ ප්‍රාග්ධනය පදනම් කර ගෙන ගොඩ නැගේ.

දිගුකාලීන ණය = ස්ථාවර පොළියක් හෝ ලාභාංශයක් සහිත ණය

හිමිකම = සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය හා සංචිත

$$\text{ණය ස්කන්ධ අනුපාතය} = \frac{\text{ණය ප්‍රාග්ධනය}}{\text{හිමිකම් ප්‍රාග්ධනය}}$$

ණය ස්කන්ධ අනුපාතය = ණය ප්‍රාග්ධනය : හිමිකම් ප්‍රාග්ධනය

හිමිකම් ප්‍රාග්ධනය ළ ණය ප්‍රාග්ධනය = අධි තෝලනය

හිමිකම් ප්‍රාග්ධනය ඝ ණය ප්‍රාග්ධනය = අව තෝලනය

පොලී ආවරණ අනුපාතය

අදාළ ආයතනය විසින් ලබා ගත් ණය සදහා කාලච්ඡේදය තුල ගෙවීමට සිදු වන පොළිය ආවරණය කර ගැනීමට ප්‍රමාණවත් ලාභයක් ආයතනය උපයා ඇත්ද යන්න මෙම අනුපාතයෙන් සලකා බළයි.

පොලී ආවරණ අනුපාතය = $\frac{\text{බදු පෙර ශුද්ධ ලාභය + පොළිය}}{\text{පොළිය}}$

මෙම අනුපාතය වාර ගණනක් ලෙස ලැබේ.

වාර ගණන ඉහල අගයක් ගනී නම් ණය වල සුරක්ශිතභාවය ඉහළ යයි.

ලාභදායීත්ව අනුපාත

ව්‍යාපාරයේ සමස්ථ කාර්යක්ෂමතාවය ලාභදායීත්ව අනුපාත මගින් සලකා බලයි.

1. දළ ලාභ අනුපාතය.
2. ශුද්ධ ලාභ අනුපාතය.
3. මුළු වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය.
4. හිමිකම් මත ප්‍රතිලාභ අනුපාතය.

දළ ලාභ අනුපාතය

විකුණුම් ආදායම හා දළ ලාභය අතර සම්බන්ධතාව පෙන්වන අනුපාතයකි

$$\text{දළ ලාභ අනුපාතය} = \frac{\text{දළ ලාභය}}{\text{විකුණුම්}} \times 100$$

ශුද්ධ ලාභ අනුපාතය

ව්‍යාපාරයේ ශුද්ධ ලාභය සහ විකුණුම් අතර සම්බන්ධතාවය මෙම අනුපාතය මගින් සලකා බලයි

$$\text{ශුද්ධ ලාභ අනුපාතය} = \frac{\text{කාලච්ඡේදයේ ලාභය}}{\text{විකුණුම්}} \times 100$$

මුළු වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය

ව්‍යාපාරයේ වත්කම් කොපමන කාර්යක්ෂමතාවයකින් කාළච්ඡේදයේ ලාභය ගණනයට දායක වී තිබේද යන්න මෙමගින් සලකා බළයි

$$\text{මුළු වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය} = \frac{\text{කාලච්ඡේදයේ ලාභය + පොළිය}}{\text{මුළු වත්කම්}} \times 100$$

අනුපාතයේ අගය ඉහල අගයක් ගන්නා තරමට ආයතනය ඉහල කාර්යක්ෂමතාවයකින් ව්‍යාපාරයේ සම්පත් භාවිතා කරන බව හදුනා ගත හැකිය.

හිමිකම් මත ප්‍රතිලාභ අනුපාතය

මෙම අනුපාතය මගින් ව්‍යාපාරයේ කොටස් කරුවන්ගේ හිමිකම මත ව්‍යාපාරය ඉපයූ ලාභය හදුනා ගනී.

හිමිකම = සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය + සංචිත

$$\text{හිමිකම් මත ප්‍රතිලාභ අනුපාතය} = \frac{\text{කාලච්ඡේදයේ ලාභය}}{\text{හිමිකම්}} \times 100$$

- මෙම අනුපාතය මත පදනම්ව කොටස් කරුවන් තවදුරටත් ව්‍යාපාරය තුල රැදෙනවාද නැද්ද යන්න තීරණය කරයි.
- නව ආයෝජකයින්ද මෙම අනුපාතය පිළිබද විශේෂ අවධානයක් දක්වයි.

ක්‍රියාකාරී අනුපාත

ආයතනයක් සිය වත්කම් කවර කාර්යක්ෂමතාවයකින් කළමනාකරණය කරන්නේ ද හා ප්‍රයෝජනයට ගන්නේ ද යන්න මැනීම සඳහා ක්‍රියාකාරී අනුපාත වැදගත් වේ

1 තොග පිරිවැටුම් අනුපාතය.

2 තොග රැඳවුම් කාලය.

3 ණයගැති පිරිවැටුම් අනුපාතය.

4 ණය එකතු කිරීමේ කාලය.

තොග පිරිවැටුම් අනුපාතය

සාමාන්‍ය තොගය විකුණුම් බවට පත් වන වාර ගණන මෙම අනුපාතය මගින් පෙන්නුම් කරයි

තොග පිරිවැටුම් අනුපාතය = විකුණුම් පිරිවැය / සාමාන්‍ය තොගය

සාමාන්‍ය තොගය = (ආරම්භක තොගය + අවසාන තොගය) / 2

තොග පිරිවැටුම් අනුපාතය ඉහළ අගයක් ගනී නම් තොග ඉක්මනින් විකිණෙන බව හැගේ. එවිට යල් පැනගිය තොග දැකිය නොහැක.

තොග රැඳවුම් කාලය

ව්‍යාපාරය මිලට ගන්නා තොග කොපමන දින ගණනක් ව්‍යාපාරයේ ගබඩාවේ රදවාගෙන සිටීද

නැතහොත් සාමාන්‍ය තොගය විකුණුම් බවට පත්වීමට ගතවන කාලය

තොග රැඳවුම් කාලය

$$= \frac{365}{\text{තොග පිරිවැටුම් අනුපාතය}}$$

මෙහිදී ලැබෙන පිළිතුර සාපේක්ෂව අඩු දින ගණනක් නම් එය ව්‍යාපාරයට යෝග්‍ය වේ.

ණයගැති :වෙළෙඳ ලැබිය යුතු දෑ* පිරිවැටුම් අනුපාතය

කාලච්ඡේදයේ සාමාන්‍ය ණයගැතියෝ සහ ශුද්ධ ණයට විකුණුම් අතර සම්බන්දය මෙම අනුපාතය මගින් සලකා බලයි. මෙහිදී සිදු වන්නේ ණයගැතියෝ විකුණුම් බවට පත් වන වාර ගණන සෙවීමයි.

$$\text{ණයගැති පිරිවැටුම් අනුපාතය} = \frac{\text{විකුණුම් පිරිවැය}}{\text{සාමාන්‍ය තොගය}}$$

$$\text{සාමාන්‍ය ණයගැතියෝ} = \frac{\text{ආරම්භක ණයගැතියෝ + අවසාන ණයගැතියෝ}}{2}$$

- මෙහි පිළිතුර වාර ගණනින් ලැබේ.
- ඉහල වාර ගණනක් ලැබීමෙන් අදහස් වන්නේ ණයට විකිණීමෙන් එම ණය නියමිත කාලයට එකතු කර ගැනීමට ව්‍යාපාරය සමත්ව ඇති බවයි.
- වාර ගණන අඩු වන විට බොල් ණය ඇති වීමේ අවදානම ඉහලය.

ණය එකතු කිරීමේ කාලය

මෙහිදී ණයට විකුණුම් වලින් ඇති වන ණයගැතියන්ගෙන් ණය එකතු කර ගැනීමට ගත වන කාලය හදුනා ගනී.

තොග රැදවුම් කාලය

$$= \frac{365}{\text{තොග පිරිවැටුම් අනුපාතය}}$$

- මෙය දින ගණන් වලින් ලැබේ.
- මෙම අනුපාතයෙන් ලැබෙන දින ගණන පහල අගයක් නම් ණය එකතු කිරීම කාර්යක්ෂම වේ.

ආයෝජන අනුපාත

ආයෝජන අනුපාත මගින් ව්‍යාපාරයක කොටස් මිළට ගන්නා පුද්ගලයෙකුට කොටසකට ලබා ගත හැකි ප්‍රතිලාභ පිළිබදව සලකා බලයි.

සාමාන්‍ය කොටස්කරුවන්ට තමන්ට හිමි ප්‍රතිලාභය, තම ආයෝජනයට ඇති ඉපැයීම හා ආයෝජන අවධානම තක්සේරු කර ගැනීමට උපකාරී වේ.

1 කොටසක ඉපයීම.

2 කොටසක ලාභාංශ

කොටසක ඉපයීම

මෙමගින් ව්‍යාපාරයේ සාමාන්‍ය කොටසකට ඉපයීමේ හැකියාව හෙවත් සමාගමේ සාමාන්‍ය කොටස්හිමියන් වෙනුවෙන් සමාගම කොපමණ ලාභයක් උපයා ඇති ද යන්න හඳුනා ගනී.

කොටසක ඉපයීම =

<u>කාලච්ඡේදයේ සාමාන්‍ය කොටස් සඳහා බෙදීමට ඇති ලාභය</u>

සාමාන්‍ය කොටස් ගණන

කොටසක ලාභාංශ

මෙම අනුපාතයෙන් එක් සාමාන්‍ය කොටසකට ප්‍රකාශ කළ ලාභයෙන් කොපමන අයත් වේද යන්න සලකා බළයි.

කොටසක ලාභාංශ =

$$\frac{\text{කාලච්ඡේදයේ සාමාන්‍ය කොටස් සඳහා බෙදා දී ඇති ලාභය}}{\text{සාමාන්‍ය කොටස් ගණන}}$$

Thank You !